රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 02/2013

මගේ අංකය :- EST-2/POLCY/03/0798
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

2013.06.21

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම**

රාජ්‍ය නිලධරයන් විසින් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගැනීමට අදාළව අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුත් කමිටුව විසින් ඉදිරිපත් කරන ලද යෝජනා 2013.06.20 දින රැස්වීමේදී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද බවත්, ඒ අනුව රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළ අංක 07/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා එහි සංශෝධන යාවත්කාලීන කරමින් සංශෝධනය කිරීම අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කළ බවත් අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා විසින් මා වෙත දන්වා ඇත.

02. එහි සඳහන් එක් යෝජනාවක් වනුයේ ඇතැම් රාජ්‍ය නිලධරයන් සඳහා දෙවන භාෂාව පිළිබඳ ලිඛිත ප්‍රවීණතාව අත්කර ගැනීමේ විකල්ප සුදුසුකමක් ලෙස දක්වා තිබූ අ.පො.ස. (සා.පෙළ) විභාගයේ සිංහල භාෂාව හා සාහිත්‍යය/දෙමළ භාෂාව හා සාහිත්‍යය ප්‍රධාන විෂයයක් (හර විෂයයක්) ලෙස සමත්වීම වෙනුවට අ.පො.ස. (සා.පෙළ) සිංහල හෝ දෙමළ භාෂාව "දෙවන බස" විෂයයෙන් සමත්වීම පිළිගන්නා බවයි. තවද, අනෙකුත් රාජ්‍ය නිලධරයන්ට ද ඔවුන් සිය කැමැත්තෙන් ඉදිරිපත් වන්නේ නම්, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණ වෙනුවට විකල්ප සුදුසුකමක් ලෙස අ.පො.ස. (සා.පෙළ) දෙවන බස සිංහල/දෙමළ විෂයයෙන් සමත්වීමෙන් අදාළ ලිඛිත ප්‍රවීණතා අවශ්‍යතාව සපුරා ගැනීමට ද හැකියාව පවතී. ඉහත සඳහන් කරුණු මෙන්ම 2013 දෙසැම්බර් මස පැවැත්වෙන අ.පො.ස. (සා.පෙළ) විභාගය සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනය විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින්, 2013 ජූලි මස 05 වන දින දක්වා දීර්ඝ කර ඇති බව පිළිබඳව ද අදාළ නිලධරයන් දැනුවත් කිරීමට පියවර ගන්නේ නම් මැනවි.

03. ඉහත පළමුවන ඡේදයේ සඳහන් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද වාර්තාවේ නිර්දේශ ඇතුළත් කරමින් ප්‍රස්තුත විෂයයට අදාළව සංශෝධිත චක්‍රලේඛයක් ළඟදීම නිකුත් කෙරෙනු ඇත.

පී.බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය